# දේදුන්නෙන් ආ මල



සඳෙව්මා ශාක්‍යා දිසානායක

# දේදුන්නෙන් ආ මල

සදෙව්මා ශාක්‍යා දිසානායක

# පිදුම

මේ පොත ලිවීමට උදව් කළ
මාගේ ආදරණීය සමන්මලී ගුරුතුමියටත්,
මාගේ දෙමාපියන්ටත් ආදරයෙන්,
මෙම පොත පුද කරමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේනම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හදුනාගෙන ඒවා ඔපවත්කිරිම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරිමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි. එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය  මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවන්ට ගැළපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හදුන්වාදෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණ අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර,
විදුහල්පතිණිය,
මහමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023.10.20


ඉස්සර කාලෙක ලස්සන මල් වත්තක් තිබුණා. ඒ මල් වත්තේ පාට පාට මල් තිබුණා. ඒ මල් වත්ත අයිති අසරණ අයට උදව් කරන, හිත හොඳ මිනිසෙකුට.



ඒ ළඟම තවත් මල් වත්තක් තිබුණා. ඒ මල් වත්තේ තිබුණේ කළු පාට මල් විතරයි. ඒ මල් වත්ත අයිති නරක, කාටවත් උදව් කරන්නෙ නැති මිනිසෙකුට.



ඒ අතර සුදු මලක් තිබුණා. ඒ සුදු මල සෑම දෙනාටම උදව් කරනවා. හරිම කරුණාවන්තයි. ඒ නිසා කළු මල්වලට සුදු මල ගැන හරිම තරහක් තිබුණා.



දවසක් මේ සුදු මල පාට පාට මල් වත්තට සමනල්ලු එන දිහා ආසාවෙන් බලාගෙන හිටියා. කළු මල්වලට හරි තරහයි.




සුදු මල ඒ දිහා බලාගෙන සතුටු වෙන නිසා කළු මල් කතා වුණා “අපි සුදු මලට කරදර කරමු“ කියලා. ඊට පස්සේ හැම කළු මලක්ම සුදු මලට විහිළු කළා, කරදර කළා.



ඉතින් මේ සුදු මල හොඳටම අඬන්න ගත්තා. හැමදාම කළු මල් සුදු මලට මෙහෙම කරදර කළා. හැමදාමත් සුදු මල හොඳටම ඇඬුවා. එයා අඬන ගමන් සිතුවා ‘‘මට මෙයාලා ගල් ගැහුවට, විහිළු කළාට මම මෙයාලා ගැන තරහක් හිතන්නේ නෑ. මම මෙයාලට මෛත්‍රී කරනවා‘‘ කියලා.



එහා පැත්තේ වත්තේ හිටපු පාට පාට මල් මේක දැකලා එයාලට ගොඩක් දුක හිතුණා. “අනේ පව් අර සුදු මලට අනිත් කළු මල් කරදර කරනවා.
අපි මේකට මොකක් හරි කරමු.“



ඉතින් පාට පාට මල් කතා වුණා “මේ සුදු මල අපේ දිහාවට ගනිමු“ කියලා. ඊට පස්සේ පාට පාට මල් සුදු මලට කිව්වා “ඔයත් අපේ දිහාවට එන්න අපි ඔයාට පාට දෙන්නම්“ කියලා.



සුදු මලට දැන් ගොඩක් සතුටුයි මේ ගැන. සුදු මල ඉක්මණින් දුවලා ආවා පාට පාට මල් වත්තට.



ඊට පස්සේ හැම මලක්ම සුදු මලට පාට දැම්මා. දැන් පාට පාට මල්වලටත් වඩා ලස්සනයි සුදු මල. දැන් එයා ගාව හැම පාටක්ම තියෙනවා. රතු, තැඹිලි, කහ, ලා කොළ, තද කොළ, ලා නිල්, තද නිල්, දම්, රෝස පාට පාට ගොඩක් තියෙනවා. දැන් සුදු මල දේදුන්නටත් වඩා ලස්සනයි.



දැන් පාට පාට මල්වලටත් ගොඩක් සතුටුයි. එදා ඉඳන් පාට පාට මලුයි, සුදු මලයි සතුටින් හිටියා. එදා ඉඳන් හැමෝම සුදු මලට කතා කළේ “දේදුන්නෙන් ආ මල“ කියලා.



# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරිම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමුලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී.

ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලගාවීමට තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනවූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතරම ඔවුන්ගේ හැගීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023.10.20

ISBN: 978-6-24206-781-0
9 786242 067810